**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය - 2020**

---

**දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2014 ජූලි 10 දින එළඹි අංක 5417- (එල්කේ) දරන මූල්‍ය ගිවිසුමෙහි 2 වන උපලේඛනයේ II (ඇ) වගන්තිය කොටසේ සහ 2010 ජූලි 31 දිනැති ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය සහ ප්‍රදාන සඳහා වූ සාමාන්‍ය කොන්දේසිවල 4:09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම වාර්තාව විගණනය අතරතුර නිරීක්ෂණය කරන ලද කරුණුවලින් සමන්විත වන අතර ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව**

---

**ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, (වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. දේශගුණික අවදානම් ඇතිවිය හැකි ජනතාව හා වත්කම් අනතුරුවලට භාජනය වීම අඩු කිරීම සහ ආපදාවලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 14,617 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 111.8 ක් වන අතර මින් රුපියල් මිලියන 14,382 කට සමාන ඇමෙරිකන් එක්සත් ජනපද ඩොලර් මිලියන 110ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවිණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 05 දින ආරම්භ කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට නියමිතව තිබුණි.**

**1.3 මතය**

---

**ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

---

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.**

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,**

- **ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.**

- **අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.**

- **භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.**

- **මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.**

**මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.**

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/ විගණන ගැටළු | වටිනාකම රු.මි. | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|---|
| **01.** | ශ්‍රී ලංකා අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක **01** හි **24** ඡේදය අනුව, වාර්තාකරණ කාලපරිච්ඡේදයට අදාළව අයවැය සමඟ මූල්‍ය ප්‍රකාශනවල නිරූපනය කළ සංඛ්‍යා සැසැඳීම් වෙන වෙනම | **1891.94** | ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති සංරචක මත පදනම්ව අයවැය ඇස්තමේන්තු පිළියෙළ කරයි. **2014** අගෝස්තුවල ව්‍යාපෘති ආරම්භයේ සිට මෙම | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතා අනුව, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | හෙළිදරව් කළ යුතුය. කෙසේනමුත් එම අවශ්‍යතාවලට අනුගත නොවී තිබුණි. | | පිළිවෙත අනුගමනය කරන ලද අතර මෙය ලෝක බැංකුව ඇතුළුව අදාළ බලධාරීන් විසින් පිළිගෙන ඇත. ඒ අනුව ඇස්තමේන්තු සහ සත්‍ය වියදම් ඇතුළත් සංසන්දනාත්මක වාර්තාවක් අමුණා ඇත. | |
| 02. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 18 ඡේදය අනුව, ඡේද අංක 21 සිට 32 දක්වා නිර්වචනය කර ඇති පරිදි මෙහෙයුම්, ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස වර්ගීකරණය කිරීම හා වාර්තා කිරීම කළ යුතුය. වර්ගීකරණය පදනම මත පහත හඳුනාගැනීම් සමඟ ඉහත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුකූල නොවුණි.<br><br>(අ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති කටයුතු සඳහා ශ්‍රී ලංකා රජයේ අරමුදලින් රුපියල් 7,000,000 ක් හා ලෝක බැංකු සහයෝගයෙන් රුපියල් 1,883,342,078 ක් වැයකර තිබුණි. ඉහත වියදමින් විශාල ප්‍රතිශතයක් ව්‍යාපෘතියේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වැය කර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි ඉහත සඳහන් කර ඇති නිර්ණායකවලට අනුකූලව වියදම් ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී, මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වියදම් කළ මුදල් එම වියදම්වල වෙන වෙනම හඳුනාගෙන නොතිබුණි. ඉහත අනුව, රුපියල් 205,084,804 ක් ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන තිබූ අතර ඉතිරි රුපියල් | 1890.34 | විමසුම අනුව, රුපියල් 3,000,000 ක් දේශීය අරමුදලින් හා රුපියල් 1,525,040,601 ක් විදේශීය අරමුදලින් දරා තිබුණි. ව්‍යාපෘතිය ආරම්භයේ සිට විගණනය වෙත ඉදිරිපත් කළ ආකෘතියම 2020 වර්ෂයේත් ඉදිරිපත් කරන ලදී. අවශ්‍ය සංශෝධන ව්‍යාපෘතියේ ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **1,772,663,385** මුළු ආයෝජන ලෙස මෙහෙයුම් ක්‍රියාකාරකම්වල හඳුනාගෙන තිබුණි. | | | |
| (ආ) අත්තිකාරම් ගිණුම් ශේෂය ප්‍රවර්ථන වර්ෂය තුළ රුපියල් **114,303,586** කින් අඩුවී තිබූ අතර වෙනත් ශේෂවල ඉතිරිය රුපියල් **26,897,246** කින් ද අඩුවී තිබුණි. ප්‍රමිතයේ නිර්ණායකවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී, ආයෝජන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් හඳුනානොගෙන ගැලපීම් සම්පූර්ණයෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට සිදුකර තිබුණි. | **141.20** | අත්තිකාරම් ගිණුම් සහ වෙනත් ගෙවීම් ශේෂයන් ව්‍යාපෘතිය විසින් විගණනයට පෙර වර්ෂවල ඉදිරිපත් කළ පරිදිම මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **02** හි **31** ඡේදය අනුව, ශ්‍රී ලංකා රජය විසින් ප්‍රවර්ථන වර්ෂයේදී රජයේ අරමුලින් දරන ලද රුපියල් මිලියන **7**ක මුදල මූල්‍ය ක්‍රියාකාරකම් මගින් ජනිත වූ මුදල් ප්‍රවාහවල වෙනම හඳුනාගෙන නොතිබුණි. | **7** | ඉදිරියේ එන මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල දේශීය අරමුදලින් දරන ලද වියදම් වෙන් කිරීම සඳහා වැඩපිළිවෙළක් ඇති කරන ලදී. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක **02** හි **59, 60, 61, 62** ඡේද යටතේ වෙනත් හෙළිදරව් කිරීමක් සිදු නොකර ඇතිහෙයින්, අදාළ මුදල් ප්‍රවාහ ප්‍රකාශන ප්‍රමිතයේ සඳහන් මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූලව නොතිබුණි. | | ව්‍යාපෘතිය විසින් ඉදිරි විගණන වෙත ඉදිරිපත් කරන මුදල් ප්‍රවාහ ප්‍රකාශනවල විගණනය පෙන්වා දුන් ගැලපීම් ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතා අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් කළමනාකරණය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 01 | සපයා ඇති තොරතුරුවලට අනුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන **5,488.91** ක වටිනාකමින් යුත් කොන්ත්‍රාත් පැකේජ **443** ක් ප්‍රදානය කර ඇති අතර, එයින් සමාලෝචිත වර්ෂය අවසානයේ කොන්ත්‍රාත් පැකේජ **382** ක් **2020** දෙසැම්බර් **31** දිනට අවසන් කර ඇත. වටිනාකම රු. මිලියන **286.04**ක් වූ කොන්ත්‍රාත් පැකේජ **27** ක් කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කර නොතිබුණි. මෙම පැකේජ මාස **01** සිට මාස **35** දක්වා ප්‍රමාද වේ. | විගණන විමසුමේ දක්වා ඇති පරිදි, CRIP අරමුදල් යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් පිරිනමන ලද රුපියල් මිලියන **286.04** ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ **27** ක් නියමිත කොන්ත්‍රාත් කාලය තුළ අවසන් නොකළ බව නිරීක්ෂණය විය. එසේම මෙම පැකේජවල ප්‍රමාදයන් මාස **01** සිට **35** දක්වා පරාසයක පවතී. අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් සහ වානේ වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය වෙළඳපොලේ නොමැතිකම, නියමිත වේලාවට පස් සහ බොරළු බලපත්‍ර ලබා ගැනීමේ අපහසුව, සංචාරක සීමාවන් යටතේ නියමිත වේලාවට ශ්‍රම බලකාය ලබා ගැනීමේ අපහසුතාව සහ පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පනවා ඇති අගුලු දැමීමේ තත්ත්වය හේතුවෙන් මෙම තත්ත්වය ඇති විය. ඒ හේතුවෙන් මෙම පැකේජ කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි විය. කොවිඩ්-19 වසංගතය බලපෑම හේතුවෙන් ලෝක බැංකුව සහ GOSL විසින් ව්‍යාපෘතිය ද දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, අවශ්‍යතා මත පදනම්ව මෙම සියලු කොන්ත්‍රාත්තු සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා දී ඇති අතර, CRIP ක්‍රියාත්මක කිරීමේ අවසන් දිනය වන **2021** අප්‍රේල් **30** වන දින වන විට සියලු සම්බන්ධතා පැකේජ සම්පූර්ණයෙන්ම සම්පූර්ණ කරන ලදී. | වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කටයුතු කිරීම අවශ්‍යවේ. ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට නිර්දේශ කිරීමට පෙර ප්‍රමාදයට හේතු හඳුනා ගැනීම සඳහා නිසි ඇස්තමේන්තුවක් කළ යුතුය. |
| 02 | සපයනු ලබන තොරතුරු වලට අනුව, කොන්ත්‍රාත් පැකේජ **86** ක් රුපියල් මිලියන **1,525.94**කට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ප්‍රදානය කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් කොන්ත්‍රාත් පැකේජ **82**ක් **2020** දෙසැම්බර් **31** දිනට අවසන් | CRIP මූල්‍යකරණය යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද රුපියල් මිලියන **203.80** ක වටිනාකමින් යුත් කොන්ත්‍රාත් පැකේජ **04** කොන්ත්‍රාත් කාලය තුළ අවසන් කර නොමැති බව සඳහන් විය. මෙම පැකේජ සම්පූර්ණ කිරීමට ප්‍රමාද කාල සීමාව මාස **32** සිට **47** දක්වා පරාසයක පවතී. අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් සහ වානේ වැනි ඉදිකිරීම් | වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කටයුතු කිරීම අවශ්‍යවේ. ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට නිර්දේශ කිරීමට පෙර ප්‍රමාදයට හේතු හඳුනා ගැනීම සඳහා නිසි ඇස්තමේන්තුවක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර ඇත. වටිනාකම රු. මිලියන 203.80ක් වූ කොන්ත්‍රාත් පැකේජ 04 ක් කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කර නොතිබුණි. මෙම පැකේජ සම්පූර්ණ කිරීමට ප්‍රමාද කාල සීමාව මාස 32 සිට මාස 47 දක්වා පරාසයක පවතී. | ද්‍රව්‍ය වෙළඳපොලේ හිඟවීම, නියමිත වේලාවට පස් සහ ගල් බලපත්‍ර ලබා ගැනීමේ අපහසුතාව, සංචාරක සීමාවන් යටතේ ශ්‍රම බලකාය ලබා ගැනීමේ අපහසුතාව සහ පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැනවූ අගුලු දැමීමේ තත්ත්වය හේතුවෙන් මෙම තත්ත්වය ඇති වූ අතර මෙම පැකේජ කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි විය. කොවිඩ්-19 බලපෑම හේතුවෙන් ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘතිය ද දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, අවශ්‍යතා මත පදනම්ව මෙම සියලු කොන්ත්‍රාත්තු සඳහා කාල දිගු කිරීම් ලබා දී ඇති අතර, CRIP ක්‍රියාත්මක කිරීමේ අවසන් දිනය වන 2021 අප්‍රේල් 30 වන විට සියලු කොන්ත්‍රාත් පැකේජ සම්පූර්ණයෙන්ම සම්පූර්ණ කරන ලදී. | |
| 03 | වටිනාකම රුපියල් මිලියන 5,297.25ක් වූ කොන්ත්‍රාත් පැකේජ 32 ක් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රදානය කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ ඉන් කොන්ත්‍රාත් පැකේජ 17ක් 2020 දෙසැම්බර් 31 දිනට අවසන් කර ඇත. වටිනාකම රුපියල් මිලියන 1,880.90ක් වූ කොන්ත්‍රාත් පැකේජ 6 ක් කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කර නොමැති අතර මාස 06 සිට මාස 46 දක්වා වූ පරාසයක ප්‍රමාද වී මෙම පැකේජ සම්පූර්ණ කර ඇත. | CRIP අරමුදල් යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 1,880.90 ක වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් පැකේජ 06 ක් කොන්ත්‍රාත් කාලය තුළ අවසන් කර නොමැති බව සඳහන් වේ. මෙම පැකේජ සම්පූර්ණ කිරීමට ප්‍රමාද කාල සීමාව මාස 06 සිට 46 දක්වා පරාසයක පැවතුණි. බොහෝ දුරට ප්‍රමාද වූ පැකේජ සමහරක් වූයේ නායයාම් අවම කිරීමේ වැඩබිම් වේ. නිරන්තර කාලගුණික විපර්යාස යටතේ නාය යෑමේ අවදානම් ප්‍රදේශවල (එනම් හඟ්ගල නායයෑම්) එවැනි නායයෑම් අවම කිරීමේ කටයුතු ඉටු කිරීමට අයහපත් ලෙස බලපායි. අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් සහ ආරක්ෂිත දැල් වැනි ආනයන සීමා කිරීම් හේතුවෙන් සංචාරක සීමාවන් යටතේ ශ්‍රම බලකාය ලබා ගැනීම සහ පවතින COVID-19 වසංගතය හේතුවෙන් පනවන ලද අගුලු දැමීමේ තත්ත්වය හේතුවෙන් මෙම තත්ත්වය ඇති වූ අතර, මෙම පැකේජ කොන්ත්‍රාත් කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි විය. COVID-19 බලපෑම හේතුවෙන් ලෝක බැංකුව | වැඩ සැලැස්මට අනුව ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට කටයුතු කිරීම අවශ්‍යවේ. ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට නිර්දේශ කිරීමට පෙර ප්‍රමාදයට හේතු හඳුනා ගැනීම සඳහා නිසි ඇස්තමේන්තුවක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සහ **GOSL** විසින් ව්‍යාපෘතිය ද දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, අවශ්‍යතා මත පදනම්ව, මෙම සියලු කොන්ත්‍රාත් පැකේජ සඳහා සුදුසු පරිදි කාල දිගු කිරීම් ලබා දී ඇති අතර, **CRIP** ක්‍රියාත්මක කිරීමේ අවසන් දිනය වන **2021** අප්‍රේල් **30** වන දිනට සියලු කොන්ත්‍රාත් පැකේජ සතුටුදායක ලෙස සම්පූර්ණ කරන ලදී. | |
| **04** | විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, රුපියල් මිලියන **13,634.98**ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ **631** ක් **2020** දෙසැම්බර් **31** දක්වා කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර ඇත. එයින් රුපියල් මිලියන **230.42** ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ **15** ක් විවිධ හේතූන් මත අතරමඟ නවතා දමා තිබුණි. | කොන්ත්‍රාත්කරුවන් අසමත් වීම, පවරා ඇති කාර්යය සම්පූර්ණ කිරීමට මෙන්ම ජල ගැටලු, ඉඩම් අත්පත් කර ගැනීමේ දුෂ්කරතා සහ එබැවින් අඛණ්ඩව කරගෙන යාම අපහසුවීම වැනි විවිධ හේතු නිසා ක්‍රියාත්මක නොවන කොන්ත්‍රාත් පැකේජ සංඛ්‍යාව ක්‍රියාත්මක කරන ආයතන විසින් අවසන් කරන ලදී. නමුත් සැලසුම් කර ඇති පරිදි වැඩ නිම කිරීමට අවශ්‍ය බැවින් බොහෝ වැඩ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් පසු නැවත ඇස්තමේන්තු කර නැවත ප්‍රදානය කරන ලදී. මේ වනවිට නැවත ප්‍රදානය කළ කොන්ත්‍රාත් අවසන් වී තිබුණි. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව වැඩ නිම කිරීමට අපොහොසත් වන අදාළ කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන ඇත. | අමතර කාලය සහ වියදම් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට ක්‍රියා කිරීම අවශ්‍ය වේ |

## 3.2 ක්ෂේත්‍ර පරීක්ෂාවේදී වූ නිරීක්ෂණ

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරීක්ෂණ |
|---|---|---|---|
| **01** | මුතූර් ඇල්ලෙයි යෝජනා ක්‍රමයේ වම් ඉවුරේ **2** ප්‍රධාන ඇළේ ඇළ බැම්මේ සහ දකුණු ඉවුරේ ප්‍රධාන ඇළේ ඇළ ඉවුරේ මාර්ගයට බොරළු දැමීම සඳහා රුපියල් **42,494,417** ක් වැය කර ඇතත්, ප්‍රසම්පාදන ලේඛනයේ **32.1** ඡේදයට අනුව සිදු කළ යුතු පරීක්ෂණ සිදුකර පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තු නිසි පරිදි සිදු කර නොමැති අතර බොහෝ ස්ථාන අබලන් තත්ත්වයේ පවතින බව ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වාරිමාර්ග අධ්‍යක්ෂ ත්‍රිකුණාමලයට අනුව, සියලුම පාංශු පරීක්ෂණ කටයුතු ඔවුන් සතුව පවතින පිරිවිතරයන්ට අනුව සිදු කර ඇත. වසර දෙකකට පමණ පෙර මෙම කාර්යය අවසන් කර ඇත. ඉන් පසු විශාල ටිපර් රථවලින් අනවසර වැලි ප්‍රවාහනය වසර පුරාත් මේ වන විටත් සිදුවෙමින් පවතී. මෙම තත්ත්වය ත්‍රිකුණාමලය වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් මුතූර් පොලිස් ස්ථානයට දන්වන /පැමිණිලි කරන ලදී. නමුත් මේ වන තෙක් වැලි ප්‍රවාහනය පාලනය කිරීමට නොහැකි වී ඇත. විගණන විමසුමේ දක්වා ඇති පරිදි මාර්ගයට විශාල වශයෙන් හානි වීමට හේතුව මෙයයි. | හානිය අදාළ පාර්ශ්වයෙන් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| 02 | **2018 ජුනි මාසයේදී මෙම ව්‍යාපෘතිය යටතේ අල්ලයි යෝජනා ක්‍රමයේ දකුණු ඉවුර ඇළ බැම්ම මත මීටර් 0+750 සිට 15+000 දක්වා කොටසේ මාර්ගය රු.මිලියන 19,298,754 ක් වැයකර සංවර්ධනය කර තිබුණි. කෙසේ වෙතත් ඉහත මාර්ගයේ මීටර් 1+950 සිට 3+050 දක්වා කොටස වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ කාපට් අතුරා තිබූ අතර 2020 ජූලි මාසයේදී වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ මීටර් 5+400 සිට 5+800 දක්වා කොටස කොන්ක්‍රීට් කර තිබුණි. එබැවින් මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ වැය වූ මුදල නාස්තිකාර වියදම් ලෙස සැලකේ.** | <u>**අල්ලයි යෝජනා ක්‍රමයේ RBMC බැම්ම මත වූ මාර්ගය**</u><br>**2020 මැද භාගයේදී ඉහත කොන්ත්‍රාත්තුව යටතේ CRIP ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු (CRIP වැඩ නිම වී වසර 2 ½ කට පසුව) ත්‍රිකුණාමල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සපයන ලද තොරතුරු වලට අනුව, CRIP අරමුදල් යටතේ මෙම කාර්යය CRIP/WORKS/ID-TRI/NCB/231-1 කොන්ත්‍රාත්තුව හරහා 2017 මාර්තු මාසයේදී ආරම්භ කර 2018 ජුනි මාසය වන විට අවසන් කර ඇත. ප්‍රදේශයේ ප්‍රජාවගේ බලවත් ඉල්ලීම මත කිලෝමීටර් 14.0 න් මීටර් 400 ක් දිග කාපට් සැපයීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව අවසර ලබා දී ඇත.** | **ආර්ථික නොවන වටිනාකම අදාළ පාර්ශවයෙන් අයකර ගත යුතුය.** |
| 03 | **මෙම ව්‍යාපෘතිය යටතේ 2018 මාර්තු මාසයේදී අල්ලයි යෝජනා ක්‍රමයේ ප්‍රධාන ඇළ බැම්මේ මාර්ගය (වෙන්ද්‍රසන් ප්‍රධාන ඇල බැම්ම පාර) මීටර් 0+00 සිට 2+950 දක්වා කොටසේ මාර්ගය රු.මි. 4,381,360 කට සංවර්ධනය කර ඇත. කෙසේ වෙතත්, ඉහත මාර්ගයේ 0+100m සිට 2+950m දක්වා කොටස 2019 වසරේ "සිරිසර පිවිසුම" සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කාපට් අතුරා තිබුණි. එබැවින් මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ වැය වූ මුදල නාස්තිකාර වියදම් ලෙස සැලකේ.** | <u>**වෙන්ද්‍රාසන් ප්‍රධාන ඇල බැම්ම පාර**</u><br>**ත්‍රිකුණාමල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සපයන ලද තොරතුරු වලට අනුව, CRIP අරමුදල් යටතේ මෙම කාර්යය CRIP/WORKS/ID-TRI/NCB/221 කොන්ත්‍රාත්තුව හරහා 2017 අප්‍රේල් මාසයේදී ආරම්භ කර 2018 මාර්තු වන විට සම්පූර්ණ කර ඇත. CRIP ව්‍යාපෘතිය යටතේ මෙම වැඩ නිම කිරීමෙන් පසු ප්‍රදේශයේ ප්‍රජාවන් තම එදිනෙදා කටයුතු සඳහා මෙම මාර්ගය භාවිතා කර ඇත. 2019 වසරේ "සිරිසර පිවිසුම" නමින් නව වැඩසටහනක් මගින් මෙම මාර්ගයේ කිලෝමීටර් 2.95 න් කිලෝමීටර 1.0 කට ආසන්න කොටසක් කාපට් කිරීමට හඳුනා ගන්නා ලදී. ඉහත කොන්ත්‍රාත්තුව යටතේ CRIP ඉදිකිරීම් ආරම්භ කරන අවස්ථාවේදී "සිරිසර පිවිසුම" වැඩසටහනේ මැදිහත්වීම සම්බන්ධයෙන් එවැනි ඉඟියක් නොතිබුණි.** | **ආර්ථික නොවන වටිනාකම අදාළ පාර්ශවයෙන් අයකර ගත යුතුය.** |
| 04 | **2019 ඔක්තෝම්බර් වල ව්‍යාපෘතිය යටතේ කන්තලේ පකිකිරාවන්වෙට්ටි හි මීටර් 0 සිට මීටර්1+020 කොටසේ නව මාර්ගය රුපියල් 4,895,354 ක් වැය කර සංවර්ධනය කර තිබුණි. කෙසේවෙතත්, ඉහත මාර්ගය 2020 සැප්තැම්බර් වල මීටර්0+00 සිට මීටර්0+100 දක්වා කොටස වෙනත් සංවර්ධන ව්‍යාපෘතියක් යටතේ කොන්ක්‍රීට් කර තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ මෙම මාර්ගන** | **ත්‍රිකුණාමල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් සපයන ලද තොරතුරු වලට අනුව, CRIP අරමුදල් යටතේ මෙම කාර්යය CRIP/WORKS/ID-TRI/NCB/222-2 කොන්ත්‍රාත්තුව හරහා 2017 ජුනි මාසයේදී ආරම්භ කර 2018 ජූලි මාසය වන විට අවසන් කර ඇත. මාර්ගයේ සම්පූර්ණ දිග කිලෝමීටර 1.0 ක් පමණ වේ.**<br>**2019 වර්ෂයේදී කන්තලේ ප්‍රාදේශීය සභාව විසින් කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රධාන මාර්ගයේ සිට ඇළ බැම්ම දක්වා මීටර් 100ක් දිග මාර්ගයක් හඳුනාගෙන එම තෝරාගත්** | **රේඛීය ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය.** |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධනය සඳහා දරන ලද වියදම නාස්තිකාර වියදමක් ලෙස සැලකිය හැක. | වැඩ අවසන් කර ඇත. 2017 වසරේ ඉහත කොන්ත්‍රාත්තුව යටතේ CRIP වැඩ ආරම්භ කරන අවස්ථාවේ මාර්ගයේ කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රාදේශීය සභා මැදිහත් වීමක් සිදු වූ බවට කිසිදු සඳහනක් නොවීය. | |
| 05 | කන්තලේ පේරාරු මාර්ගයේ බෝක්කු දෙකක් රුපියල් 468,285ක් වැය කර ඉදිකර තිබුණද වසර දෙකක කාලයක් එම බෝක්කු දෙක ප්‍රයෝජනයට නොගෙන තිබුණේ අදාළ පාරවල් මේ දක්වා ඉදිකර නොතිබීම හේතුවෙනි. | හඳුනාගැනීමේ අදියරේදී තමන්ට බෝක්කු දෙකක් පමණක් ලබාදෙන ලෙස ගොවි සංවිධානය ඉල්ලා ඇති අතර සහභාගිත්ව ප්‍රවේශය යටතේ තම ශ්‍රමය යොදාගෙන තමන්ම මාර්ගය සකස් කර ගැනීමට ඔවුන් එකඟ විය. එබැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් බෝක්කු දෙකක් ඉදිකිරීම සඳහා පමණක් ඇස්තමේන්තු කර ඇත. පවතින COVID-19 වසංගත තත්ත්වය සහ එය ජනතාවට ඇති කරන බලපෑම් සහ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඔවුන්ගේම ශ්‍රමය යොදවා වැඩ තවමත් සිදු කර නොතිබිණි. | මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කළ යුතුය. |
| 06 | කන්තලේ කුසුමන්කඩවල ඇළේ පැති බැම්ම ඉදිකිරීමේ මුල් සැලැස්මට අනුව බැම්මේ ඉහළ කොටස මීටර් 0.6ක් පළල විය යුතුය. බැම්මේ මුදුන මීටර් 0.45ක් පළලින් පමණක් ඉදිකර ඇති බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | මෙම පැති බැම්මේ ඉහල කොටස මීටර් 0.6 ක් සඳහා ඇස්තමේන්තු කර ඇත. නමුත් ඉදිකිරීම් අතරතුර අඩවියේ කොන්දේසි වලට අනුකූල වීම සඳහා උස මීටර් 0.45 දක්වා අඩු කරන ලදී. සත්‍ය මිනුම්වලට අනුව ගෙවීම් සිදුකර ඇති අතර සිදු කරන ලද සත්‍ය කාර්යයට වඩා අමතර ගෙවීම් කිසිවක් සිදු කර නොමැත. | ස්ථානීය තත්ත්වය පිළිබඳව නිසි අවධානය යොමු කර ඇස්තමේන්තුව සකස් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දිය යුතුය. |

### 3.3 පද්ධති සහ පාලනයන්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 01 | ව්‍යාපෘතියේ ගිණුම්කරණ කටයුතු සඳහා රු. මිලියන 7.4ක පිරිවැයකට පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වා දී තිබුණි. කෙසේ වෙතත් අදාළ මෙහෙයුම් අත්පොත් සකස් කර නොතිබූ අතර ක්‍රියාකාරකම් සඳහා ප්‍රවේශය ලබා දීමට සහ මෘදුකාංගයේ නිශ්චිත තොරතුරු අවබෝධ කර ගැනීමට මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණය සහ මෙහෙයුම් සහ ඇගයීම් සඳහා සහාය වීම සඳහා පූර්ව විස්තර කළ ආකෘති සහ අභිරුචි කළ ආකෘතිය මත පදනම්ව වාර්තා එකතු කිරීම, ගබඩා කිරීම, සැකසීම සහ ජනනය කිරීම සඳහා ව්‍යාපෘති තොරතුරු කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කර තිබුණි. කළමනාකරණ තොරතුරු පද්ධතිය ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන, කොන්ත්‍රාත් කළමනාකරණය, වත්කම් කළමනාකරණය, වැටුප් කළමනාකරණය සහ අධීක්ෂණ සහ ඇගයීම යන මොඩියුල කිහිපයකින් | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා මෘදුකාංග පද්ධතිය භාවිතා කළ යුතුය. මෙහෙයුම් අත්පොත ලබා ගත යුතුය. මෘදුකාංග පද්ධතිය අදාළ අධිකාරිය වෙත ව්‍යාපෘතියේ අවසානයේ භාරදීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | | සමන්විත වේ. එක් එක් මොඩියුලය සඳහා, දත්ත ඇතුළත් කිරීම, සැකසීම සහ වාර්තා උත්පාදනය සඳහා විවිධ අතුරුමුහුණත් භාවිතා කිරීම සඳහා නිශ්චිත කාර්යයන් පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ සහ තාක්ෂණික අවබෝධය සැපයීම සඳහා සවිස්තරාත්මක මෙහෙයුම් අත්පොත් සකස් කර ඇත. කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතා කරන්නන් සඳහා උපදේශක විසින් අන්තර්ක්‍රියාකාරී පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. | |
| 02 | ව්‍යාපෘතිය 2021දී නිම කිරීමට සැලසුම් කර ඇති නිසා ඉන්පසුව අදාළ අරමුණු ළඟාකර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කරන බව විගණනයට නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම මත, වත්කම් අදාළ ආයතනවලට හිමිවන අතර ඔවුන් විසින් ඒවා නඩත්තු කරනු ලැබේ. එම ආයතනවල අවශ්‍යතාවය සඳහා එම වත්කම් සඵලදායීව යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳ ව්‍යාපෘතිය විසිනුත් මාර්ගෝපදේශ සපයනු ලැබේ. | වත්කම්වල පැවැත්ම තහවුරු කළ යුතුය. |